# ACCOUNTING CONCEPTS (Part-VI)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# උපචිත සංකල්පය

නිශ්චිත කාලච්ඡේදයක් සඳහා ව්‍යාපාරයක මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීමේ දී කාලච්ඡේදයට අදාළ සියලු ආදායම් මුදලින් ලැබී ඇතත්, නැතත් ආදායම් ලෙස ද, කාලච්ඡේදයට අදාළ සියලු වියදම් මුදලින් ගෙවා තිබුණත්, නැතත්, වියදම් ලෙස ද හඳුනාගත යුතු බව මෙම සංකල්පයෙන් අදහස් වේ.

ගිණුම්කරණ කාලච්ඡේදයේ නිවැරදි මූල්‍ය ප්‍රතිඵලය අනාවරණය කිරීම සඳහා උපචිත සංකල්පය වැදගත් වේ.

ClassWork.LK

# උපචිත සංකල්පය යෙදෙන අවස්ථා :

- උපචිත වියදම් / ගෙවිය යුතු වියදම් වාර්තා කිරීමේදී
- ඉදිරියට ගෙවූ වියදම් / පෙර ගෙවුම් වාර්තා කිරීමේදී
- ලැබිය යුතු ආදායම් / උපචිත ආදායම් වාර්තා කිරීමේදී
- කලින් ලද ආදායම් / ඉදිරියට ලද ආදායම් වාර්තා කිරීමේදී
- ණයගැතියෝ වාර්තා කිරීමේදී
- ණයහිමියෝ වාර්තා කිරීමේදී

ClassWork.LK

## උපචිත වියදම් :

ගිණුම් කාලච්ඡේදයට අදාළ නමුත්, ගිණුම් වර්ෂය අවසාන දින වන විටත් ගෙවා නොමැති වියදම්. උපචිත වියදම් ලෙස හැඳින්වේ. මෙය වගකීමකි.

මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීමේ දී උපචිත වියදම් ගැලපුම් කළ යුතු ය.

## අදාළ ද්විත්ව සටහන / ගැලපුම් සටහන

| |
|---|
| අදාළ වියදම් ගිණුම හර |
| උපචිත වියදම් ගිණුම බැර |

ClassWork.LK

**<u>නිදසුන :</u>**

017/03/31 දිනෙන් අවසන් වර්ෂය තුළ ගෙවූ විදුලි බිල්වල වටිනාකම රු. 14 200 කි. නමුත් වසරට ලද විදුලි බිල්වල වටිනාකම රු. 22 000 කි.

- ඉහත ගණුදෙනුවේ උපචිත වියදම් සඳහා අදාළ ගැලපුම් සටහන වන්නේ,

| | රු | රු |
|---|---|---|
| විදුලි බිල් ගිණුම හර | රු. 7 800 | |
| උපචිත විදුලි බිල් ගිණුම | | රු. 7 800 |

- ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු වර්ෂයේ විදුලිබිල්වල වටිනාකම රු. 22 000 කි.

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් තුළ දැක්විය යුතු වටිනාකම රු. 7 800 කි.

ClassWork LK

## ඉදිරියට ගෙවූ වියදම් / පෙර ගෙවුම් :

ගිණුම් කාලච්ඡේදයට අදාළ ප්‍රමාණයට වඩා වැඩිපුර කාලයක් සඳහා ගෙවා ඇති වියදම් ප්‍රමාණයයි. මෙය වත්කමකි.

### අදාළ ගැලපුම් සටහන

| | |
|---|---|
| ඉදිරියට ගෙවූ වියදම් ගිණුම හර | |
| අදාළ වියදම් ගිණුමට | බැර |

ClassWork.LK

**<u>නිදසුන :</u>**

වර්ෂයට අදාළ රක්ෂණ වාරිකය රු. 24 000 ක් වුවත් වර්ෂය තුළ දී රු. 25 000 ක් ගෙවා ඇත.

- ඉහත ගණුදෙනුවේ ඉදිරියට ගෙවූ වියදම් සඳහා අදාල ගැලපුම් සටහන වන්නේ,

| | රු | රු |
|---|---|---|
| ඉදිරියට ගෙවූ රක්ෂණ ගිණුම හර | රු. 1 000 | |
| රක්ෂණ ගාස්තු ගිණුම | | රු. 1 000 |

- ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කළ යුතු රක්ෂණ ගාස්තුව රු. 24 000 කි.

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ ජංගම වත්කම් වල දැක්විය යුතු වටිනාක ම රු. 1 000කි.

ClassWork LK

## ලැබිය යුතු ආදායම්

ගිණුම් කාලච්ඡේදයට අදාළ නමුත් ගිණුම් කාලච්ඡේදය අවසාන දින වන විටත් ලැබී නැති ආදායම් ප්‍රමාණය, ලැබිය යුතු ආදායම් ලෙස හැඳින්වේ. මෙය වත්කමකි.

## අදාළ ගැළපුම් සටහන

| | |
|---|---|
| ලැබිය යුතු ආදායම් ගිණුම හර | |
| අදාළ ආදායම් ගිණුම | බැර |

ClassWork.LK

**<u>නිදසුන :</u>**

ව්‍යාපාරයේ ගොඩනැගිල්ලෙන් කොටසක් මසකට රු. 5 000 බැගින් කුලියට දී ඇත. ගිණුම් වර්ෂය තුළ ලැබූ ගෙවල් කුලිය රු. 50 000 කි.

- ඉහත ගණුදෙනුවේ ලැබිය යුතු ආදායම් සඳහා අදාළ ගැලපුම් සටහන වන්නේ,

| | රු | රු |
|---|---|---|
| ලැබිය යුතු ගෙවල් කුලී ගිණුම හර | 10000 | |
| ගෙවල් කුලී ආදායම් ගිණුම | බැර | 10000 |

- **ආදායම් ප්‍රකාශනයට** ඇතුළත් කළ යුතු ගෙවල් කුලී ආදායම රු. 60 000 කි.

- මූල්‍ය තත්ත්වයේ ප්‍රකාශනයේ **ජංගම වත්කම්වල** දැක්විය යුතු වටිනාකම රු. රු. 10 000 කි.

ClassWork.LK

# <u>කලින් ලද ආදායම්</u>

ගිණුම් කාලච්ඡේදයට වඩා වැඩිපුර කාලයක් සඳහා ලැබී ඇති ආදායම් ප්‍රමාණය, කලින් ලද ආදායම් ලෙස හැඳින්වේ. මෙය වගකීමකි.

## <u>අදාළ ගැළපුම් සටහන</u>

| | |
|---|---|
| අදාළ ආදායම් ගිණුම | හර |
| කලින් ලද ආදායම් ගිණුම | බැර |

ClassWork.LK

## නිදසුන :

ව්‍යාපාරයේ ගොඩනැගිල්ලේ කොටසක් මසකට රු. 5 000 බැගින් කුලියට දී ඇති අවස්ථාවක ගිණුම් කාලච්ඡේදය තුළ රු. 75 000 ක ගෙවල් කුලී ආදායමක් ලැබී ඇත.

- ඉහත ගණුදෙනුවේ කලින් ලද ආදායම් සඳහා අදාළ ගැලපුම් සටහන වන්නේ,

| | රු | රු |
|---|---|---|
| ගෙවල් කුලී ආදායම් ගිණුම | හර 15 000 | |
| කලින් ලද ගෙවල් කුලී ආදායම් ගිණුම | | බැර 15 000 |

- ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කළ යුතු ගෙවල් කුලී ආදායම රු. 60 000 කි.

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම්වල දක්විය යුතු වටිනාකම රු. 15 000 කි.

ClassWork.LK

උපචිත සංකල්පය මත ගනුදෙනු වාර්තා කළ විට ණයහිමියන් හා ණයගැතියන් ජනිත වේ.

ලැබිය යුතු ආදායම්, ඉදිරියට ගෙවූ වියදම්, ගෙවිය යුතු වියදම්, කලින් ලද ආදායම්, ණයගැතියෝ සහ ණයහිමියෝ ද උපචිත සංකල්පයට අදාළ යෙදීම් වේ.

ClassWork.LK

**<u>අභ්‍යාස</u>**

(01) උපචිත සංකල්පය පැහැදිලි කරන්න.

(02)

| | ගෙවූ රු. | ගෙවිය යුතු රු. |
|---|---|---|
| විදුලිය | 4000 | 2000 |
| රක්ෂණ වාරික | 2000 | 2000 |

1) ඉහත සඳහන් ගනුදෙනුවලට ගැලපුම් සටහන් ඉදිරිපත් කරන්න.

2) ගිණුම් වර්ෂයට අදාළ ආදායම් හා වියදම් හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු වටිනාකම දක්වන්න.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura